කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

IWWRMP

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය
## (IWWRMP)

## ව්‍යාපෘති අංකය : P166865
## ණය අංකය : IDA- 6619-LK

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ලෝක බැංකුව) වෙත ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) පිරිවැය අරභයා ණය මුදලක් සඳහා අයදුම්කර ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක් පහත උපලේඛනයේ සඳහන් කොන්ත්‍රාත්තු යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වගුව 01 හි සඳහන් පරිදි ජල සම්පත් මණ්ඩලය යටතේ වන පහත සඳහන් ඉදිකිරීම් කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**වගුව 01**

| **කොන්ත්‍රාත් අංකය** | **වැඩ විස්තරය/ කොන්ත්‍රාත් කාලය** | **CIDA ලියාපදිංචිය / විශේෂත්වය** | **නැවත නොගෙවන ලිපිලේඛන ගාස්තුව (රු.)** | **ලංසු සුරක්ෂණය වලංගු කාලය** | **ඉදිකිරීම් කර්මාන්තයේ වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය හා ද්‍රවශීල වත්කම් හා/ හෝ ණය පහසුකම්වල අවමය (රු.) (වැට් සහිත)** |
|---|---|---|---|---|---|
| LK-MOMDE-367174-CW-RFB | යාපනය කලාපයේ පළාත් භූගත ජල කළමනාකරණ ඒකකය ස්ථාපිත කිරීම අදියර 01 (දින 300) | ශ්‍රේණිය : C4 සහ ඉහළ විශේෂත්වය : ගොඩනැගිලි ඉදිකිරීම් | රු. 33,000.00 | ලංසු සුරක්ෂණ වටිනාකම රු. 2,730,000.00 වලංගු කාලය 2027.01.11 දක්වා (දින 147) | මිලියන 264.0 සහ මිලියන 55.0 |

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු ලිපිලේඛනයේ සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය. තවද සාර්ථක ලංසුකරු ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂත්වය යටතේ ඉහත වගුවේ සඳහන් ශ්‍රේණිය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) වලංගු ලියාපදිංචියක් ලබා තිබිය යුතුය.

4. ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීම සඳහා **https://www.iwwrmp.lk/ web/procurement/section/procurement-notices** යන වෙබ් අඩවියේ පළ කර ඇත.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ අංක 96 පිහිටි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) වෙතින් ලබාගත හැකි අතර, පෙර දැනුම් දීමක් මගින් 2026.07.28 දින සිට 2026.08.17 දක්වා (වැඩ කරන දිනයන් හිදී) පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. (දුරකථන අංකය: 0112691163)

6. අපේක්ෂිත ලංසුකරුවන්ට, ඉහත සඳහන් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා වන නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව (මුදල සඳහා වගුව 01 බලන්න) මුදලින් ගෙවීමෙන් අනතුරුව පූර්ව දැනුම් දීමකින් පසු (දුරකථන අංක : 011–2691163) 2026.07.28 දින සිට 2026.08.17 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වැඩකරන දිනයන්හි කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ අංක 96 හි මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ලේ 2 වන මහලේ IWWRM ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත සමාගමේ/ ආයතනයේ ලිපි ශීර්ෂයක ලියන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ලංකා බැංකුවේ හයිඩ් පාක් ශාඛාවේ ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය නමින් පවත්වාගෙන යනු ලබන අංක 7042633 දරන ගිණුමට එකී නැවත නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව බැර කර ලබාගත් බැංකු තැන්පතු පත්‍රිකාවේ ස්කෑන් කරන ලද පිටපතක් ලංසු ලිපිලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීම් ලිපියක් සමග **iwwrmp@sltnet.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

7. පූර්ව ලංසු රැස්වීමක් හා වැඩ බිම් සංචාරයක් පහත වගුව 2 හි සඳහන් පරිදි පවත්වනු ලැබේ. අදාළ නිලධාරීගේ සහාය ඇතිව වැඩ බිම පරීක්ෂා කර බලන මෙන් ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**වගුව 02**

| **කොන්ත්‍රාත් අංකය** | **වැඩ විස්තරය** | **වැඩ බිම් සංචාරය** | **පූර්ව ලංසු රැස්වීම** | **ලංසු අවසන් කිරීම් සහ විවෘත කිරීම් (දිනය සහ වේලාව)** |
|---|---|---|---|---|
| LK-MOMDE-367174-CW-RFB | යාපනය කලාපයේ පළාත් භූගත ජල කළමනාකරණ ඒකකය ස්ථාපිත කිරීම අදියර 01 | **දිනය :** 2026-08-05<br>**වේලාව :** පෙ.ව. 10.00<br>**ස්ථානය :**<br>අංක 665/6, වෙරළ පාර, ගුරුනගර් යාපනය.<br>(GPS: 9.651394N, 80.023626E) | **දිනය :** 2026-08-07<br>**වේලාව :** පෙ.ව.10.00<br>**ස්ථානය :** සම්මන්ත්‍රණ කාමරය, IWWRMP/PMU, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය, ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07. | **දිනය :** 2026-08-18<br>**වේලාව :** ප.ව. 2.00<br>**ස්ථානය :** සම්මන්ත්‍රණ කාමරය, IWWRMP/ PMU, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය, ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07. |

8. ලංසු ලිපිලේඛනයේ සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කර ඔහුගේ මුද්‍රාව තබා තිබිය යුතුය.

9. සම්පූර්ණ කරන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව, බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය පැහැදිලිව සඳහන් කර වගුව 02 හි සඳහන් පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ, IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 වෙත ලියාපදිංචි තැපැල් මගින්, අතින් ගෙනවිත් භාරදීමෙන් හෝ සීඝ්‍රදූත සේවාව මගින් යොමු කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ දෙදෙනෙකුට (2) නොවැඩි බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය ගොඩනැගිල්ල,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**

**2026.07.27**